# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1973 සැප්තැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 27/68.

**අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි ඇතැම් තනතුරුවල පදවි නාමයන් වෙනස් කිරීම සඳහා ද ඇතැම් අලුත් තනතුරු ඇති කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අධ්‍යාපන අධ්‍යක්ෂගේ පදවි නාමය වෙනස් කිරීම.

**2.** අධ්‍යාපන අධ්‍යක්ෂ, සියලු කාර්යයන් සඳහා 'අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්' යන පදවි නාමයෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එසේ සඳහන් කරනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව—

185 අධි.

(1) අධ්‍යාපන ආඥාපනතින්, 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතින්, 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතින්, හෝ වෙන යම් ලිඛිත නීතිය කින් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පවරනු ලැබූ හෝ භාර කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ යුතුකමක් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් පාවිච්චි කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය; තවද

(2) ඉහත කී යම් නීති ප්‍රඥප්තියක හෝ වෙන යම් ලිඛිත නීතියක හෝ යම් ලිඛිත නීතියකින් නියමිත හෝ බලය පවරනු ලැබූ යම් දැන්වීමක, නිවේදනයක හෝ වෙනත් ලේඛන යක හෝ ආකෘතියක (සම්පූර්ණ පදවි නාමයෙන් හෝ 'අධ්‍යක්ෂ' යන කෙටි පදවි නාමයෙන්) අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහන් කර ඇති සෑම පද සම්බන්ධයක ම 'අධ්‍යාපන අධ්‍යක්ෂ' යන වචන වෙනුවට 'අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්' යන වචන ආදේශ කළ යුතු ය.

අධ්‍යාපන නිලධරයාගේ, දිස්ත්‍රික්ක පරීක්ෂකගේ හා මාණ්ඩලික පරීක්ෂකගේ පදවි නාම වෙනස් කිරීම.

**3.** (අ) එක් එක් අධ්‍යාපන නිලධරයා, සියලු කාර්යයන් සඳහා 'ප්‍රධාන අධ්‍යාපන නිලධරයා' යන පදවි නාමයෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එසේ සඳහන් කරනු ලැබිය යුතු ය;

(ආ) එක් එක් දිස්ත්‍රික්ක පරීක්ෂකවරයා සියලු කාර්යයන් සඳහා 'අධ්‍යාපන නිලධරයා' යන පදවි නාමයෙන් හඳුන්වනු ලැබිය යුතු අතර, එසේ සඳහන් කරනු ලැබිය යුතු ය; එමෙන් ම

ජ 00184—10,332 (73/7)

(ඇ) එක් එක් මාණ්ඩලික පරීක්ෂකවරයා සියලු කාර්යයන් සඳහා 'මාණ්ඩලික අධ්‍යාපන නිලධරයා' යන පදවි නාමයෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එසේ සඳහන් කරනු ලැබිය යුතු ය;

185 අධි. තවද, ඒ අනුව අධ්‍යාපන ආඥාපනතෙහි, 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතෙහි, 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතෙහි හෝ වෙන යම් ලිඛිත නීතියක හෝ වෙන යම් ලිඛිත නීතියකින් නියමිත හෝ බලය පවරනු ලැබූ යම් දැන්වීමක, නිවේදනයක හෝ වෙනත් ලේඛනයක හෝ ආකෘතියක (දිස්ත්‍රික්ක පරීක්ෂකයකු හෝ මාණ්ඩලික පරීක්ෂකයකු සම්බන්ධයෙන් ඒ සම්පූර්ණ පදවි නාමයන්ගෙන් හෝ 'පරීක්ෂක' යන කෙටි පදවි නාමයෙන්) අධ්‍යාපන නිලධරයකු හෝ දිස්ත්‍රික්ක පරීක්ෂකවරයකු හෝ මාණ්ඩලික පරීක්ෂකවරයකු සඳහන් කර ඇති සෑම පද සම්බන්ධයක ම 'අධ්‍යාපන නිලධරයා' හෝ 'දිස්ත්‍රික්ක පරීක්ෂක' හෝ 'මාණ්ඩලික පරීක්ෂක' හෝ 'පරීක්ෂක' යන වචන වෙනුවට අවස්ථාවෝචිත පරිදි 'ප්‍රධාන අධ්‍යාපන නිලධරයා' හෝ 'අධ්‍යාපන නිලධරයා' හෝ 'මාණ්ඩලික අධ්‍යාපන නිලධරයා' යන වචන ආදේශ කළ යුතු ය:

එසේ වුව ද 1966 ඔක්තෝබර් 1 වන දිනෙන් ආරම්භ ව 1972 ජූනි 30 වන දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා, සහ එම කාල පරිච්ඡේදය සඳහා පමණක්, එක් එක් දිස්ත්‍රික්ක පරීක්ෂකවරයකු 'අධ්‍යාපන උපදේශක' යන පදවි නාමයෙන් සියලු කාර්යයන් සඳහා හඳුන්වනු ලැබිය යුතු අතර, එසේ සඳහන් කරනු ලැබිය යුතු ය.

185 වන අධිකාරයෙහි 2අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. අධ්‍යාපන ආඥාපනතේ 2අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු පහත සඳහන් අලුත් වගන්තිය එම ආඥාපනතේ 2 වන වගන්තියට ඉක්බිති ව ම ඇතුළත් කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙහි ඇතැම් අලුත් තනතුරු ඇති කිරීම.

2අ. (1) (අ) නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

(ආ) නිශ්චිත ව සඳහන් අධ්‍යාපන අංශ පිළිබඳ අධ්‍යක්ෂවරුන්,

(ඇ) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

විශයෙන් හෝ එසේ ක්‍රියා කිරීම පිණිස තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

(2) තත් කාලයෙහි ධුරය දරන සෑම නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයකු, නිශ්චිත ව සඳහන් යම් අධ්‍යාපන අංශ පිළිබඳ සෑම අධ්‍යක්ෂවරයකු හා සෑම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු මේ ආඥාපනත යටතේ යථා පරිදි පත් කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(3) මේ ආඥාපනතින්, 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතින් 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් තමා වෙත පවරනු ලැබූ හෝ භාර කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් කාර්යයක්, බලයක් හෝ යුතුකමක් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් යම් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයකු වෙත හෝ නිශ්චිත ව ම සඳහන් යම් අධ්‍යාපන අංශ පිළිබඳ යම් අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු වෙත හෝ යම් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු වෙත පැවරිය හැකි ය.".

5. මේ පනත ආරම්භ වීමට පෙරාතුව අධ්‍යාපන අධ්‍යක්ෂ හා වෙන යම් පාර්ශ්වයක් විසින් ඇති කරගනු ලැබූ සෑම ගිවිසුමක් හෝ එකඟවීමක් එදින හෝ එදිනට පසු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් හා ඒ වෙනත් පාර්ශ්වය විසින් යථා පරිදි ඇති කර ගනු ලැබූ ලෙස සැලකිය යුතු ය. ගිවිසුම් හා එකඟවීම්.

6. මේ පනත 1966 ඔක්තෝබර් මස පළමු වන දින වලංගු වූ ලෙස සැලකිය යුතු ය. මේ පනත අතීතයට බලපාන ලෙස ක්‍රියාත්මක වීම.